**ශීර්ෂය 114 - ප්‍රවාහන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |

## 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් ප්‍රවාහන අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම්, ගබඩා අත්තිකාරම් ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 114 | ප්‍රවාහන අමාත්‍යාංශය | 2015 ජූනි 05 |
| 306 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 2015 ජූනි 25 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2015 දෙසැම්බර් 18 |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම්, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

#### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 81,134 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 76,337 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 46 ක සිට රු.මිලියන 4,438 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 01 ක සිට සියයට 18 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 114 | 25,010 | 20,572 | 4,438 | 17.74 |
| 306 | 53,692 | 53,379 | 313 | 0.58 |
| 307 | 2,432 | 2,386 | 46 | 1.89 |
| **එකතුව** | **81,134** | **76,337** | **4,797** | **5.91** |

**2.2 ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 02 ක් විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 04 ක් සඳහා එකතුව රු.මිලියන 13,937 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 15,200 ක ආදායම් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 90 ක සිට සියයට 115 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.01.01.00 | 5,129.00 | 5,909.31 | 780.31 | 15.21 |
| 10.03.01.00 | 1,150.00 | 1,114.85 | (35.15) | (3.06) |
| 10.03.07.04 | 58.00 | 51.94 | (6.06) | (10.45) |
| 20.03.02.14 | 7,600.00 | 8,123.80 | (523.80) | (6.89) |
| **එකතුව** | **13,937.00** | **15,199.90** | **1,262.90** | 9.06 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 02 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11401 | 8.00 | 3.00 | 2.90 | 3.90 | 34.00 | 16.85 |
| 30601 | 540.00 | 410.39 | 290.00 | 308.86 | 1,800.00 | 779.65 |
| 30701 | 28.00 | 24.00 | 17.00 | 19.00 | 125.00 | 100.00 |

### 2.3.2 ගබඩා අත්තිකාරම් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවකට අදාල ගබඩා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 30602 | 2,200 | 2,180 | 1,200 | 1,272 | 6,602 | 6,313 | 1,000 | - |

## 2.4 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 383 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 329 ක් විය.

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ප්‍රවාහන අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම්, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 5 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

# 3 ශීර්ෂ 114 - ප්‍රවාහන අමාත්‍යාංශය

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක ,උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |

**3.2 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.5,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර අමාත්‍යාංශය විසින් ඉන් එකතුව රු.3,870,713 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු. 1,129,287 ක් හෙවත් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22.59 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. අමාත්‍යාංශය වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම නිකුත් නොකිරිම නිසා මෙම ඉතිරිවීම් සිදු වු බව විසර්ජන ගිණුමේ සඳහන් කර තිබුණි.

**(ආ)** වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.25,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ඇ)** වැය විෂයයන් 22 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------------**

විෂය අංක 11401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,035,256 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

**(ආ)** නිලධාරීන් 06 දෙනෙකුගේ වර්ෂ 02 කට වැඩි 03 ට අඩු කාල පරාසයක සිට පැවැත එන රු.469,303 ක ණය ශේෂ හා නිලධාරියෙකුගේ වර්ෂයකට වැඩි වර්ෂ දෙකකට අඩු කාලයක සිට පැවැත එන රු.129,901 ක් වශයෙන් එකතුව රු.599,204 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට සමාලෝචිත වර්ෂයේදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ)** 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**(ආ)** 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු භාණ්ඩ අයිතම 37 කට අදාල භාණ්ඩ 160 ක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 756 පරිදි කටයුතු කර නොතිබුණි.

**3.5 විදේශාධාර ව්‍යාපෘති**

**------------------------**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ මාතර - කතරගම නව දුම්රිය මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ණය ගිවිසුම අනුව ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 36,166 ක් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 11,123 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර මූල්‍යාණය ව්‍යාපෘතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව China National Machinery Import Corporation ආයතනය වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ 8.3 කොන්දේසිය අනුව කොන්ත්‍රාත් වැඩසටහන ඉදිරිපත් කර තිබුණද, 2014 ජූලි මාසය වන විට වසරකට අඩු කාල සීමාවක් තුළ අවස්ථා 06 කදී කොන්ත්‍රාත් වැඩසටහන සංශෝධනය කර තිබුණි. 2014 ජූලි 24 දින එනම් විගණිත දිනය වන විට හයවන වරට සංශෝධිත වැඩසටහන කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණද, එම වැඩසටහනට අනුව ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලැසුම් කළ දින වන විටත් මූලික අයිතමයන් 12 ක වැඩ ආරම්භ කර නොතිබුණි. එම කොන්ත්‍රාත් වැඩසටහන් මූලික අධ්‍යයනයකින් තොරව සකසා තිබීම නිසා වැඩසටහන් සංශෝධනය කිරීමට සිදු වී තිබුණි.

**3.6 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**වයාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

ප්‍රවාහන අමාත්‍යාංශය විසින් නව දුම්රිය මාර්ග ඉදි කිරීම සඳහා වෙනම අංශයක් පිහිටුවා වසර ගණනාවක් ප්‍රතිපාදන සළසා දී තිබුණත්, කිසිදු ව්‍යාපෘතියක් සක්‍රීයව ක්‍රියාත්මක කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| | ව්‍යාපෘතිය | 2011 – 2014 කාල පරිච්ඡේදය තුළ ප්‍රතිපාදනය රු.මිලියන | 2011 – 2014 කාල පරිච්ඡේදය තුළ වියදම රු.මිලියන | වියදම සළසා තිබුණු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස | 2014 වර්ෂය තුළ ක්‍රියාකාරීත්වය |
|---|---|---|---|---|---|
| **(i)** | කොට්ටාව - හොරණ දුම්රිය මාර්ගය ඉදි කිරීම | 38.0 | 02.7 | 07 | ක්‍රියාකාරී වූ බවට විගණනයට සාක්ෂි නොවීය. |
| **(ii)** | කුරුණෑගල - හබරන හරහා දඹුල්ල දුම්රිය මාර්ගය ඉදි කිරීම | 118.9 | 04.7 | 04 | - එම - |
| **(iii)** | කොළඹ - හම්බන්තොට කැළණිවැලි දුම්රිය මාර්ගය ඉදි කිරීම | 110.0 | -- | -- | - එම - |
| **(iv)** | මැදවච්චිය - ත්‍රිකුණාමලය දුම්රිය මාර්ගය ඉදි කිරීම | 53.0 | 10.7 | 20 | - එම - |
| **(v)** | වැල්ලවාය - බිබිල - බදුල්ල දුම්රිය මාර්ගය ඉදි කිරීම | 40.0 | 01.7 | 04 | - එම - |
| **(vi)** | ත්‍රිකුණාමලය - මාහෝ - පුත්තලම දුම්රිය මාර්ගය ඉදි කිරීම | 16.0 | -- | -- | - එම - |

**3.7 අනාර්ථික ගනුදෙනු**

**---------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) අනාර්ථිකව කැමරා කුලී ගෙවීම.**

**--------------------------------**

ප්‍රවාහන අමාත්‍යාංශයේ මාධ්‍ය අංශය භාවිතා කරන Sony – HVR – HR 1000 P දරන වීඩියෝ කැමරාව අළුත් වැඩියා කිරීම සඳහා රු.198,048 ක් වැය කර තිබුණි. එම කාලයට වෙනත් කැමරාවක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.303,105 ක් (දිනකට රු.2,350/- ක් බැගින්) වැයකර තිබුණි. පවතින කැමරාව නිතර අළුත්වැඩියා කිරීමට සිදු වීමත් ඒ සඳහා බොහෝ කාලයක් ගතවීමත් සහ එම කාලය සඳහා කුලියට කැමරාවක් ගැනීමට විශාල මුදල් ප්‍රමාණයක් වැයවීම මත අලුත් කැමරාවක් මිලදී ගැනීමට කටයුතු නොකිරීම නිසා ඉහත පරිදි ආර්ථික නොවූ වියදමක් කිරීමට සිදු වී තිබුණි.

**(ආ) වීඩියෝ පිටපත් සඳහා අනාර්ථික ලෙස රු. 180,620/- ක් වැය කිරීම.**

**--------------------------------------------------------------------**

ප්‍රවාහන අමාත්‍යාංශයේ මාධ්‍ය ආවරණ සංස්කරණය සහ එම සංස්කරණය කරන ලද වීඩියෝ පට පිටපත් ලබා ගැනීම පෞද්ගලික අංශය මගින් සිදු කර තිබුණි. එම වියදම්වලින් වැඩි ප්‍රමාණයක් (සියයට 90 ක් පමණ) වීඩියෝ පට සංස්කරණය සඳහා නොව වීඩියෝ පිටපත් ලබා ගැනීම සඳහා වැය කර තිබුණි. ඩීවීඩී ලියවීම කළ හැකි පරිගණක යන්ත්‍රයක් යොදා ගෙන DVC, CD සහ DVD පිටපත් ලබා නොගෙන පසුගිය මාස 04 තුළ පමණක් එසේ වීඩියෝ පට පිටපත් ලබා ගැනීම සඳහා රු. 180,620 ක් වැය කර තිබුණි.

**3.8 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයේ සෑම අංශයක් සඳහාම ඍජු දුරකථන සම්බන්ධතා 28 ක් ලබා දී තිබියදී 2014 වර්ෂයේදී පොදු දුරකථන සම්බන්ධතාවය හරහා ලබා ගත් ඇමතුම්වලට රු.339,139 ක් වැය කර තිබුණි.

(ආ) සෘජු දුරකථන හා පොදු දුරකථන වියදම්වලට අමතරව කිසිදු නිලධාරියෙකු යටතේ නොපැවතුණු දුරකථන 03 ක් (ආරක්ෂක, තාක්ෂණ හා ක්‍රමසම්පාදන අංශය) සඳහා රු.276,263 ක් වැය කර තිබුණු අතර එම දුරකථනවල මාසික වියදම නිලධාරියකුට ලබා දෙන දුරකථන සීමාවද ඉක්මවා තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 20 | 05 |
| **(ii)** | තෘතියික මට්ටම | 05 | 03 | 02 |
| **(iii)** | ද්විතියික මට්ටම | 137 | 84 | 53 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 45 | 31 | 14 |
| **(v)** | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 03 | -- | 03 |
| | **එකතුව** | **215** | **138** | **77** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පඩු 77 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**(ආ) නිෂ්කාර්ය මානව සම්පත්**

නව දුම්රිය මාර්ග ඉදි කිරීම් ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන් 10 දෙනෙකුට වර්ෂ 02 ක් තුළ නිශ්චිත කාර්යක් පවරා ප්‍රගතියක් ඇති වන පරිදි කටයුතු නොකර වැටුප් වශයෙන් පමණක් රු.6,068,979 ක් ලබා දී තිබුණි.

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **සේවක වර්ගය** | **සංඛ්‍යාව** | **වෙනත් පාර්ශවය** |
|---|---|---|---|
| **(i)** | රාජ්‍ය කළමණාකරන සහකාර | 01 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| **(ii)** | කාර්යාලීය කාර්ය සහයක | 12 | - එම - |
| **(iii)** | පරිගණක ක්‍රියාකරු | 01 | ලංකා ගමනාගමන මණ්ඩලය |
| **(iv)** | රියදුරු | 06 | - එම - |

## 4. ශීර්ෂ 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### 4.1 ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් මාස 01 කට වැඩි ප්‍රමාදයකින් පසුව විගණනයට ඉදිරිපත් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂ / ආදායම් සංකේතය / විෂය අංකය** | **ගිණුමේ නම** | **ගිණුම් ඉදිරිපත් කළ දිනය** | **2015 මැයි 31 දින වන විට ප්‍රමාදය** |
|---|---|---|---|
| | | | **මාස** |
| 306 | විසර්ජන ගිණුම | 2015 ජුනි 22 | 02 |
| 20.01.01.00 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තු ආදායම් ගිණුම | 2015 අප්‍රේල් 02 | 01 |
| 30601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය | 2015 මැයි 07 | 01 |
| 30602 | ගබඩා අත්තිකාරම් ගිණුම | 2015 මැයි 20 | 01 |

### 4.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව |

## 4.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 54 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 22 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.2,046,689,870 ක් විය.

## 4.4 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

වැය විෂයයක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 3,200 ක් වුවත්, භාණ්ඩාගාරයෙන් අවශ්‍ය අග්‍රිම නොලැබීම නිසා ඉන් රු.මිලියන 2,910 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 290 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 4.5 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 15 කට අවස්ථා 15 කදී එකතුව රු.1,390,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ආ)** මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වුවත්, එම රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 16 කදී නිලධාරීන් 16 ක් වෙත රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.1,415,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

## 4.6 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ **(ඉඩම් තැන්පතු හැර)** එකතුව රු. 135,946,260 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.7 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් 20.01.01.00 දරන ආදායම් සංකේතය යටතේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වර්ෂයේ රැස්කළ රු.මිලියන 5,423 ක ආදායම කෙරෙහි සැලැකිලිමත් නොවී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 5,128 ක් ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 781 ක් හෙවත් ඇස්තමේන්තුගත ආදායම සියයට 15 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.1,571,205,201 ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 52 ක් අතර කාල පරාසයකට අදාල විය.

(ඇ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාල අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඈ) ආදායම් සංකේතයට අදාලව රැස්කර තිබුණු එකතුව රු.21,280,520 ක්වූ ආදායම් හඳුනාගෙන අදාල ආදායම් සංකේතවලට බැර කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා වූ කාලයක සිට රඳවාගෙන තිබුණි.

(ඉ) රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල වෙනුවෙන් ඉල්ලුම් කර ලබා නොගත් වාර ප්‍රවේශපත්‍ර 11,027 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. 1,102,700 ක දඩ මුදල් අයකර ගැනීමට කළමණාකරනය කටයුතු කර නොතිබූ අතර එය 2014 වර්ෂය වෙනුවෙන් රු.598,400 ක්ද, 2013 වර්ෂය වෙනුවෙන් රු.504,300 ක්ද ලෙස පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය

## 4.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 30601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 84,842,951 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු. 678,115,631 ක්වූ, අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ශේෂය රු.682,293,436 ක් විය.මේ අනුව රු.4,177,805 ක් වු වෙනස 2004 වර්ෂයේ සිට පැවත එමින් තිබුණත්, 2015 මාර්තු 31 දින වන විටත් එය සසඳා නිවැරිදි කිරිමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.791,606,075 ක්වූ අතර එදිනට දෙපාර්තමේන්තුවේ පාලන ගිණුමේ ශේෂය රු.779,649,041 ක් වී තිබුණි. ඒ අනුව රු.11,957,034 ක වෙනසක් පැවැතුණි.

(ඈ) උප දෙපාර්තමේන්තු කාර්යාල 19 කට අදාලව මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 1047 කගේ එකතුව රු. 52,238,501 ක්වූ හිඟහිටි ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.4 හා 4.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ගැනිමට දෙපාර්තමේන්තුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) උප දෙපාර්තමේන්තු කාර්යාල 18 ක සේවය හැර ගිය නිලධාරීන් 4071 ක් ගෙන් අයවිය යුතු එකතුව රු.21,417,616 ක ණය ශේෂයයන් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව එම මුදල් ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) උප දෙපාර්තමේන්තු 13 කට අනුයුක්තව සිට වැඩ තහනම් කරනු ලැබූ සේවකයින් 462 කගෙන් හිඟහිටි ණය ශේෂ එකතුව රු. 10,194,343 ක් වී තිබුණි. එම ශේෂ දීර්ඝ කාලයක සිට පැවැත එමින් තිබුණත්, 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.8 වගන්තිය ප්‍රකාරව රජයේ නිලධාරියෙකු හෝ සේවකයකු වෙනත් රාජ්‍ය සංස්ථාවකට හෝ මණ්ඩලයකට සේවය සඳහා මුදා හරින්නේ නම් ඊට ප්‍රථම ඔහු ලබා ගෙන තිබුණු ණය ශේෂ සියල්ල මුදල් ගෙවා නිරවුල් කළ පසු සේවයෙන් මුදාහැරිය යුතු වුවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නාවලපිටිය උප දෙපාර්තමේන්තුවේ සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 05 කට වැඩි කාලයක සිට පැවැත එන රු.58,940 ක ණය ශේෂය අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**4.9 ගබඩා අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**--------------------------------------------------**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදි ගබඩා අත්තිකාරම් කටයුතු එකක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1993 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින වන විටත් භාණ්ඩ ආනයනයේදී රේගු ගාස්තු වශයෙන් රු.183,807,173 ක් ගෙවා තිබුණත්, එම වියදම 2014 දෙසැම්බර් 31 දින වන විටත් තොගයට ගලපා නොතිබුණි. 1993 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා නිරවුල් නොකළ හිඟහිටි ණය ශේෂය රු.45,521,770 ක් වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලදී සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනා ගන්නා ලද රු. 524,062 ක්වූ තොග අයිතම 11 ක අතිරික්තයක් හා වටිනාකම සඳහන් කර නොතිබුණු තොග අයිතම 03 ක අතිරික්ත තොග ගබඩාවේ පැවති අතර එම තොග අතිරික්තයේ වටිනාකම ගබඩා අත්තිකාරම් ගිණුමේ තොග ශේෂයට ගැලපුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී සිදු කරන ලද ගබඩා භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද රු.20,547,393 ක්වූ, තොග අයිතම 242 ක් හා වටිනාකම සඳහන් කර නොතිබුණු තොග අයිතම 79 ක් ඇතුළත් එම තොග ඌනතාවය ගබඩා අත්තිකාරම් ගිණුමේ පෙන්වා ඇති අවසන් තොග වටිනාකමට ගැලපීම් කර නොතිබුණි. එම ඌනතා අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද, ගබඩා අධිකාරී විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) 1998 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විදේශීය රටවලින් භාණ්ඩ හා සේවා ඇණවුම් කර ගෙවීම් කර තිබුණත්, නිරවුල් කර නොතිබුණු ණයවර ලිපි වටිනාකම රු.1,030,609,935 ක් වි තිබුණි. සමාලෝචිත වර්ෂයේදිත් එම පසුගිය වර්ෂයන්ට අදාල ණයවර ලිපි වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු.205,751,770 ක් වටිනා භාණ්ඩ ඇණවුම් කර සැපයුම්කරුවන්ට ගෙවීම් කර තිබුණි. එම භාණ්ඩවලින් රු.77,045,483 ක් වටිනා භාණ්ඩ ගබඩාවට ලැබුණු බවට සනාථ වන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම භාණ්ඩ සපයා නොතිබුණත්, ඒ සම්බන්ධව කිසිදු ක්රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) 1980 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන්ට එකතුව රු.21,078,844 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එසේ ගෙවා තිබුණු අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි. එසේ නිරවුල් කර නොතබුණු අත්තිකාරම් අතරින් රු.5,914,962 ක් සමාලෝචිත වර්ෂයේදි ලබා දි තිබුණු අත්තිකාරම් වි තිබුණි. මෙම අත්තිකාරම් නිරවුල් කර ගැනීමට හෝ අදාල නිළධාරින්ගෙන් අය කර ගැනීමට හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.10 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.10.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරී 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**4.10.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**4.11 වත්කම් කළමනාකරණය**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **වත්කම් වර්ගය** | **ඒකක ගණන** |
|---|---|---|
| **(i)** | වාහන (දුම්රිය මැදිරි) | 135 |
| **(ii)** | රෝද 4 (දුම්රිය/ගැල්) | 603 |
| **(iii)** | බොගි සහිත දුම්රිය මැදිරි | 256 |
| **(iv)** | දුම්රිය ඇන්ජින් | 18 |
| **(v)** | මෝටර් රථ | 03 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 4.12 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| **(i)** | VIII වැනි පරිච්ඡේදයේ 3.2 වගන්තිය | 371,522 | ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුවේ කාර්යාලීය කාර්ය මණ්ඩලයට පවරන ලද සාමාන්‍ය රාජකාරි හා අමතර රාජකාරි නිශ්චිතව හඳුනා ගැනීමක් නොමැතිව හා කල වැඩය පිළිබඳ ලියා තහවුරුවක් නොමැතිව 2014 මැයි හා ජුනි මාසවල වැටුප් පත්‍ර මඟින් අතිකාල වශයෙන් රු. 371,522 ක් ගෙවා තිබුණි. එම පුනරාවර්තන වියදම, මූලධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. |
| **(ii)** | VIII පරිච්ඡේදයේ 5.6 වගන්තිය | 960,341 | දුම්රිය නියාමකවරු 68 දෙනෙකුට සතියකට වැඩ කළ යුතු සාමාන්‍ය පැය ගණන අඩු කිරීමෙන් තොරව එම කාලයේදී රු.960,341 ක අතිකාල ලෙස ගෙවීම් කර තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**---------------------------------**

| | | | |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 94 | 355,690,000 | මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුව සහ සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුව විසින් සළසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා බැදීම් ඇති කර ගෙන තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 137(5) | 3,201,139 | නානුඔය දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය විසින් සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබුණු බව තහවුරු කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 139(4) හා (5) | 2,485,075 | ගෙවීම් ලද බව සනාථ කෙරෙන කුවිතාන්සි හෝ වවුචරයට අත්සන් ලබා නොගෙන 2013 හා 2014 වර්ෂවලදි වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 143(3)(ඕ) | 4,633,145 | දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපතිවරුන් විසින් දෛනිකව ප්‍රේෂණය කළ රු.4,633,145 ක ආදායම් ලද බවට ප්‍රධාන ගණකාධිකාරී විසින් කුවිතාන්සි නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 177 (1) හා (3) | 17,150 | එකතු කරන ආණ්ඩුවේ මුදල් දිනපතා ප්‍රතිග්‍රාහක කාර්යාලයට අප්‍රමාදව යැවිය යුතු වුවද, ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ උපදෙස් පරිදි දෛනික ආදායමින් ගමන් වියදම් වශයෙන් රු 17,150 ක මුදලක් දුම්රිය ස්ථානාධිපති විසින් 2015 ජනවාරි මාසයේදී රඳවා ගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (vi) | මුදල් රෙගුලාසි 185( බී) | 550,901,439 | මුදල් පොතේ ලැබීම් සටහන් හා වෙනත් ගිණුම් පොත්වල ලියා ඇති බැර සටහන් වරින්වර සසදා බැලීමකට විධිවිධාන යොදා ඒ අනුව කටයුතු කළ යුතු වුවත්, නියැදි විගණන පරීක්ෂාවකදී දුම්රිය ස්ථාන 05 ක එසේ සැසඳීම් කර නොතිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 187(3) | 167,322,277 | සරප් අංශයේ නිලධාරීන් විසින් වැටුප් හා අත්තිකාරම් ගෙවීමට දිවයින පුරා දුම්රිය ස්ථානවලට යාම නිසා, සරප් අංශය වෙත දුම්රිය ස්ථානවලින් දෛනිකව ලැබෙන මුදල් මළු 1807 ක් පමණ ගණනය කිරීමකින් තොරව සේප්පුවේ රඳවාගෙන තිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 751 | 169,118 | මිලදී ගන්නා ලද භාණ්ඩ ගබඩාවට ලැබී ඒවා වවුචර් මඟින් තහවුරු කිරීමෙන් පසුව අදාල ගෙවීම් කිරීම සඳහා එම වවුචර් ඉදිරිපත් කළ යුතු වුවද, 2014 වර්ෂයේ මිලදී ගැනීම් වෙනුවෙන් ගබඩා භාරකරුගේ තොග පොතෙහි භාණ්ඩ ලද බව සටහන් කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. |
| (ix) | මුදල් රෙගුලාසි 762 සහ 763 | 110,421,146 | 2014 වර්ෂයේ එකවර සොලිඩ් වීල් ඒකක 1000 ක් මිලදී ගෙන තිබුණි. මේ නිසා එම භාණ්ඩ අයිතමයේ උපරිම තොග මට්ටම ඒකක 200 කින් ඉක්මවා මිලදී ගැනිම සිදු කර තිබුණි. |

**(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 2010 ඔක්තෝබර් 29 දිනැති අංක 5/2010 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 03 ඡේදය | 511,451 | කොළඹින් පිට පලාත්වල සේවක කාර්ය මණ්ඩල වැටුප් ඔවුන්ගේ බැංකු ගිණුමට ප්‍රේෂණය කර නොතිබුණි. සරප් කාර්ය මණ්ඩලය මගින් ගෙවීම් කිරීම නිසා ඔවුන්ට අතිකාල, ගමන් වියදම්, දුම්රිය |

| | | | |
|---|---|---|---|
| | | | මැදිරි වෙන් කිරීම වැනි කාර්ය සඳහා ජනවාරි මාසයේදී පමණක් රු.511,451 ක අතිරේක වියදමක් කර තිබුණි. |
| (ii) | 2012 මාර්තු 05 දිනැති අංක DM3/C2/43/PR/vi/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | 2,083,610 | සංඥා හා විදුලි සංදේශ ව්‍යාපෘතිය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ තාක්ෂණ ශිල්පී සහයක , ස්ථිර මාර්ග පරීක්ෂක, ලිපිකරු හා වාත්තුකරු වශයෙන් 155 දෙනෙකු අනුයුක්ත කර 2013 වර්ෂයේදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස ඉටු කරන ලද රාජකාරි පිළිබඳ ලිඛිත තහවුරුවකින් තොරව රු.2,083,610 ක් ගෙවා තිබුණි. |
| **(ඇ)** | **දුම්රිය සාමාන්‍යාධිකාරිගේ පොදු උපදෙස් සංග්‍රහය** | | |
| **(i)** | දුම්රිය පොදු උපදෙස් සංග්‍රහයේ 2.6 ඡේදය | 630,000 | මූලස්ථානයේ ප්‍රවේශපත්‍ර සැපයීම් අංශයෙන් ලැබෙන ප්‍රවේශපත්‍ර දුම්රිය AB 68 තොග ලෙජරයේ සටහන් නොකර දුම්රිය ස්ථාන වෙත නිකුත් කර තිබූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ii) | දෙපාර්තමේන්තු පොදු උපදෙස් සංග්‍රහයේ 02 පරිච්ඡේදයේ 3.15.2 ඡේදය | 272,860 | මරදාන දුම්රිය ස්ථානයේ රු. 272,860 ක් වටිනා 9252 ක ප්‍රවේශපත්‍ර තොගයක් අස්ථානගත වීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |

## 3.13 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යාධාරය යටතේ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,319,507,488 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදවීම නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2014 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| ----------- | -------------- | ------------- | ------------- | ----------- | ------------- | -------------- |
| | රු.මිලියන | | | | රු.මිලියන | |
| මඩු - තලෙයිමන්නාරම් දුම්රිය මාර්ග ඉදි කිරීම | 149.50 | 2011.03.29 | 2013.09.29 | 2014.09.29 | 5,124.34 | මිල විචලනයක් අනුමත නොවීම, බොරලු සැපයීමේ ප්‍රමාදය, අයහපත් කාලගුණය |
| පලෙයි - කන්කසන්තුරේ දුම්රිය මාර්ගය ඉදි කිරීම | 149.34 | 2012.06.14 | 2014.06.13 | -- | 7,092.18 | අධි ආරක්ෂිත කලාපයේ ඉදි කිරීම් ප්‍රමාදය හා බොරළු සැපයීම් ප්‍රමාදය |

## 4.14 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු.

### (අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්

බැංකු ගිණුම් 07 කට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

**2015 මැයි 31 දින වනවිට පිළියෙල කර නොතිබුණු බැංකු සැසඳුම්වලට අදාල වර්ෂය සහ මාසය**

| | |
|---|---|
| **(i)** | 2014 දෙසැම්බර් |
| **(ii)** | 2014 දෙසැම්බර් |
| **(iii)** | 2014 සැප්තැම්බර් |
| **(iv)** | 2014 දෙසැම්බර් |
| **(v)** | 2014 දෙසැම්බර් |
| **(vi)** | 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| **(vii)** | 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |

**(ආ) අක්‍රීය බැංකු ගිණුම්**

දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබූ ජංගම ගිණුමක් 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 07 කට වැඩි කාලයක සිට අක්‍රීයව පැවතුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට මෙම බැංකු ගිණුමේ රු.3,026,878 ක ශේෂයක් බැංකු ප්‍රකාශනය අනුව පෙන්නුම් කර තිබුණත්, එයට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) ගැලපුම් කළයුතු ශේෂ**

දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසදුම් ප්‍රකාශවල ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | **ගැලපුම් පිළිබඳ විස්තර** | **මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු** |
|---|---|---|
| | | **රු.** |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් | 566,418 |
| (ii) | හඳුනා නොගත් හර | 63,744 |
| (iii) | හඳුනා නොගත් බැර | 2,637 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

නිකුත් කර තිබූ නමුත් බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණු රු.35,276 ක චෙක්පත් නිකුත් කළ දිනයන් වෙනස් කරමින් බැංකු සැසදුමේ සඳහන් කර තිබුණි. කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.15 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත දුම්රිය දෙපාර්තමේන්තුවේ දෛනික අවශ්‍යතාවය සඳහා මෙට්‍රික් ටොන් 7000 ක රේල් පීලි මිලදී ගෙන තිබුණු අකර ඉන් රු.මිලියන 1,473 ක රේලි පිලි පලෙයි - කන්කසන්තුර ව්‍යාපෘතියට නිකුත් කර තිබුණි. එසේ නිකුත් කළ රේල් පිලිවලින් රු. මිලියන 149 ක රේල් පීලි එම ව්‍යාපෘතිය වෙත ලද බව තහවුරු කිරිමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඕමන්ත සිට පලෙයි දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීමේ ව්‍යාපෘතියේ දුම්රිය මාර්ගයට යොදා තිබුණු රු. මිලියන 80 ක් පමණ වටිනා සිල්පර 6849 ක් පලුදු වී තිබුණි. සිල්පර පිළිබඳ ආයතනයේ සහතිකය මත පමණක් කටයුතු කර මෙම මිලදී ගැනිම සිදු කර තිබුණු අතර සිල්පර වල තත්ත්වය පිළිබඳ පිළිගත හැකි පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) නානුඔය දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ ගොඩනැඟිලි අංශයේ වේලා සටහන් පත් නියැදියක් පරීක්ෂා කිරීමේදී එම වේලා සටහන් පත්වල කල වැඩ වාර්තා සම්පූර්ණ කිරීමකින් තොරව අතිකාල හා ගමන් වියදම් වශයෙන් එකතුව රු.127,338 ක් ගෙවා තිබුණි.

## 4.16 අවිධිමත් ගනුදෙනු

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) ටැබ්ලට් පරිපථ සඳහා භූගත කේබල් (Armored Under Ground Cable 2 X 1.5 mm) මීටර් 57 ක් රු.6,208,440 ක් වැයකර මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනිම රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වඩාත් තරඟකාරී මට්ටමෙන් ලංසු කැඳවීම නොකර එම ගනුදෙනුවේ වටිනාකම කොටස් 07 කට බෙදා මිලදී ගැනිම් සිදු කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාරගෝපදේශය ප්‍රකාරව රු.මිලියන 5 ඉක්මවූ මිලදී ගැනීම් සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ කටයුතු නොකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අවස්ථා 03 කදී රු.මිලියන 5 ඉක්මවා රු.28,117,978 ක් වැය කර අයිතම 03 ක් මිලදී ගෙන තිබුණි.

(iii) S 8 Class Radiator Elements ඒකක 40 ක් රු.16,576,000 කට මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර අවස්ථා 04 කදී ඒකක 10 බැගින් මිලදී ගෙන තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීමට සාධාරණ හා උපරිම අවස්ථාව ලබා දිය යුතු වුවත්, එසේ නොකර ඉඩම් හා ගොඩනැගිලි බදු දී තිබුණි. මාතලේ දුම්රිය රක්ෂිතයේ ඉඩම් සහ දුම්රිය ගොඩනැගිලි දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බදුකරුවෙකු විසින් මාසිකව රු.20,000 කට ලබාගත් පරිශ්‍රයක් නැවත එම බදු කරු විසින් උප බදු දී තිබුණි. ඔහු විසින් එම උප බදු දුන් පාර්ශවයන්ගෙන් ඒ සදහා රු. 250,000 ක අත්තිකාරම් ලබා ගෙන තිබුණු අතර රු. 20,000 බැගින් මාසිකව එම ගොඩනැගිල්ල පාර්ශව 02 කට උප බදු දී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාත්‍යන්තර මිලදී ගැනීමකදී තරඟකාරී ලංසු සඳහා අවම වශයෙන් දින 42 ක් කාලයක් ලබා දිය යුතු වුවත්, විදේශ මිලදී ගැනීම් අවස්ථා 05 කදී එකතුව රු.163,833,576 කට අදාල ප්‍රසම්පාදන දැන්වීම, ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පසුව ලැබී ඇති බවද නිරීක්ෂණය විය. මෙයට අමතර වශයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව උනන්දුව දක්වන සැපයුම්කරුවන්ට සහභාගී වීමට සාධාරණ, සමාන හා උපරිම අවස්ථාව ලබාදී නොතිබුණි.

(vi) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගොපදේශය ප්‍රකාරව වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමකින් තොරව හදිසි මිලදී ගැනීම් යටතේ රු 256,145 ක භාණ්ඩ 2014 මැයි මාසයේදී මිලදී ගෙන අත්තිකාරම් වවුචර් මඟින් එම මුදල නිරවුල් කර තිබුණි. මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ ගබඩාවට ලැබුණු බව තහවුරු කර ගෙන නොතිබුණි.

(vii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශ සංග්‍රහයේ වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමය යටතේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන අනුමැතිය යටතේ රු.මිලියන 2 කට වඩා අඩු භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අවම වශයෙන් මුද්‍රා තබන ලද මිල කැඳවුම් 05 කින් තෝරා ගත යුතු වුවද, එක් සැපයුම්කරුවකුගේ මිල පදනම් කර ගෙන රු 1,593,974 වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(viii) කොන්ත්‍රාත් කොන්දේසි 4.4 වගන්තිය (B) හා (C) ට අනුව කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත් ලබා දීමට ඉංජිනේරුවරයාගේ මූලික අනුමැතිය සහ උපකොන්ත්‍රාත් වැඩ ආරම්භ කිරීමට දින 28කට පෙර ඒ සඳහා දැනුම් දිය යුතු වුවද, සංඥා පද්ධති ස්ථාපිත කිරිම, ගොඩනැඟිලි ඉදි කිරීම වෙනුවෙන් 2014 ජුනි මාසය අවසානයේ කොන්ත්‍රාත්කරු වෙත ඇ.ඩො. 2,483,124 ක් ගෙවා තිබුණත්, උපකොන්ත්‍රාත් ලබා දිම සඳහා ලිඛිත අනුමැතියක් ලබා ගෙන නොතිබුණි

**4.17 පාඩු හා හානි**
**--------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2011 නොවැම්බර් 23 දිනැති අංක ව.ආ/පොදු/2011/05 දරන දුම්රිය දුම්රිය සාමාන්‍යාධිකාරිගේ චක්‍රලේඛය ප්‍රකාරව දුම්රිය හරස් මාර්ගයේ සවිකල ආරක්ෂිත ගේට්ටුවට අලාභ සිදුකල පාර්ශවයන්ගෙන් අයවිය යුතු රු. 100,000 ක මුදලක් අලාභයන් සිදු කළ පාර්ශවයෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූලස්ථානයේ ලෙජරය අනුව දුම්රිය ස්ථාන වෙත සැපයූ බවට සටහන් තබා තිබුණු නමුත් දුම්රිය ස්ථාන වෙත නොලැබු රු.595,000 ක් වටිනා ප්‍රවේශපත්‍ර 9000 ක ලැබීම් අදාල දුම්රිය ස්ථාන තොග පොතේ සටහන් කර නොතිබුණි.

(ඇ) 1987 ජනවාරි 05 දිනැති අක 887 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිවාස කුලිය සංශෝධනය නොකිරීමෙන් උප දෙපාර්තමේන්තු 03 කට අදාල නිවාස 145 කින් ලැබිය යුතු රු.1,930,076 ක් රජයට අහිමි වී තිබුණි.

(ඈ) අවස්ථා 03 කදී දුම්රිය දෙපාර්තමේන්තුව සතු රු.940,357 ක් වටිනා දේපලවලට සිදු වූ අලාභ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසියට පැමිණිලි කිරීමෙන් තොරව දුම්රිය ආරක්ෂක අංශයට පමණක් පැමිණිලි කර තිබුණි. එම හානි සිදු කළ පුද්ගලයන් හඳුනා ගෙන ඔවුන්ට විරුද්ධව විනය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා විගණිත දිනය වූ 2015 මැයි 31 දින වන විටත් එම අලාභය අයකර ගෙන නොතිබුණි.

(ඉ) ත්‍රිකුණාමලය ගොඩනැගිලි පරීක්ෂක කාර්යාලය වෙත ද්‍රව්‍ය ඉල්ලුම්පත්‍ර අංක 527258, 527259 සහ 527263 මගින් ලබා ගෙන තිබූ රු.12,668 ක ද්‍රව්‍ය භාවිතා කරමින් ඉටු කරන ලද කාර්යය ඉටු කළ බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මෙම අලාභ අයකර ගැනීමට සහ අදාළ වගකිව යුතු නිලධාරින්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) නාවලපිටිය ගොඩනැඟිලි පරික්ෂක කාර්යාලයට අයත් නිල නිවාස 102 ක වර්ග අඩි 82,445 ක භූමි ප්‍රමාණයක් නිලධාරීන්ට බදු නොදීම නිසා එම නිවාස විනාශවීමේ අවදානමකට ලක් වී තිබුණි. එම නිල නිවාසවල උළුවහු, දොර හා ජනෙල් ඇතුළු වටිනා දේපළ සොරුන් විසින් ගලවා ගෙන තිබූ අතර එම අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(උ) අම්බලංගොඩ දුම්රිය ස්ථානාධිපති විසින් 2009 ඔක්තෝබර් මාසයේ සිට 2015 මාර්තු මාසය දක්වා එකතු කළ දෛනික ආදායම් රු.121,735 ක් ප්‍රධාන ගණකාධිකාරී වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඌ) විදේශයන්ගෙන් ගෙන්වන ලද රු.77,040,268 කට අගය කළ භාණ්ඩ 2013 මැයි මාසයේදී වරායේදී ඇති වූ ගින්නෙන් විනාශ වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදු කර මුදල් රෙගුලාසි 104 ප්‍රකාර අලාභහානි අයකර ගැනීම පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(එ) යල් පැන ගිය හා අභාවිත ද්‍රව්‍යවලින් උද්ගත වූ පාඩු වශයෙන් රු.13,829,758 ක ශේෂයන් වර්ෂ ගණනාවක් මුළුල්ලේ ගිණුම්වල ඉදිරියට ගෙනවිත් තිබුණි. එම ශේෂය කපා හැරීම සඳහා අදාල පියවර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.18 අනාර්ථික ගනුදෙනු

--------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වෙයන්ගොඩ දුම්රිය ස්ථානය අවට පිහිටි කඩ කාමර 08 ක් 2007 වර්ෂයේ සිට වසා දමා තිබුණු අතර ඒවායේ විදුලිය විසන්ධි නොකිරීමෙන් විදුලිය සඳහා ස්ථාවර ගාස්තු ලෙස විගණන දිනය වූ 2014 නොවැම්බර් 30 දිනට රු.259,233 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) එකම සැපයුම්කරුගෙන් මිල ගණන් 02 ක් යටතේ තොග අංක RA 33/1/1 අයිතමය භාණ්ඩ අවශ්‍යතාවය හා අනුමත මිලදී ගැනීම් සීමාව ඉක්මවා අවස්ථා 02 කදී එනම් ඒකක 2010 ක් හා ඒකක 303 බැගින් කොටස් කර මිලදී ගැනීම නිසා රු.560,790 ක පාඩුවක් රජයට සිදු වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) විදේශයෙන් ගෙන්වන ලද භාණ්ඩ වරායෙන් නිසි කලට වේලාවට මුදා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව තුළදී පමණක් රු.1,287,679 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට ගබඩා උප දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණි.

(ඈ) SRS(C)RG 3188/10 ගොනුව මගින් අවස්ථා 02 කදී එනම් තොග අංක RG 8/10/83 යටතේ ඒකක 100 ක්ද, RG 8/10/82 මගින් තවත් ඒකක 100 ක්ද, වශයෙන් මිලදී ගැනීමේදී විනිමය අනුපාත වෙනස් වීම මත රු.369,308 ක පාඩුවක් රජයට සිදු වී තිබුණි.

(ඉ) එකම නිලධාරීන්ගෙන් සැදුම්ලත් ටෙන්ඩර් මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් 17 දින පැවැති ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් අංක 97 මගින් O Rings P/No 70042906000 (M T U Germany) තොග අයිතමය ඒකක 120 ක් ඒකක 60 බැගින් අවස්ථා 02 කදී ආයතන 02 කින් මිලදී ගැනීමට තීරණය කිරීම නිසා රජයට රු.27,600 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඊ) 2014 ජනවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා කාලය තුළ වාහන 33 කට අදාල වාහන ආදායම් බලපත්‍ර නිසි කාලපරිච්ඡේදයේ ඉල්ලුම් කර ලබා නොගැනීමෙන් රු.40,800 ක දඩ මුදලක් අනාර්ථික ලෙස ගෙවා තිබුණි.

(උ) දුම්රිය ස්ථානවල ඇති බර කිරන තරාදි, විද්‍යුත් තරාදි බවට පරිවර්තනය කිරීම සඳහා එකතුව රු.2,803,915 ක වියදම අවස්ථා 38 ක් යටතේ ඉටු කරගෙන ගෙවීම් කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී එකම තොග අංකය (1/01/16) අවස්ථා 02 කදී මිල ගණන් දෙකක් යටතේ මිලදී ගැනීම නිසා ආයතනයට රු.5,478,186 ක අලාභයක් සිදු වී තිබුණි.

**4.19 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) රත්මලාන පිහිටි දුම්රිය නිල නිවාස 680 ක් සඳහා වෙනම ජල මීටර සවි නොකර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජල සැපයුමෙන්ම ජලය සපයා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පමණක් ලබා ගන්නා ජලය වෙනුවෙන් රු.58,490,539 ක් දෙපාර්තමේන්තුව වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධව අප්‍රමාදව කටයුතු කළ යුතු වුවත්, කොළඹ ප්‍රවාහන අධිකාරි කාර්යාලය වෙත 2001 වර්ෂයේ සිට 2014 නොවැම්බර් මාසය දක්වා ඉදිරිපත් කළ විනය කරුණු 154 ක් හා නාවලපිටිය ප්‍රවාහන අධිකාරි කාර්යාලය වෙත 2011, 2013 හා 2014 යන වර්ෂවල ඉදිරිපත් කළ විනය කරුණු 11 ක් සම්බන්ධයෙන් අදාල පරීක්ෂණ පවත්වා විනය ක්‍රියාමාර්ග ගැනීම හෝ නීතිමය කටයුතු කිරීම 2015 මැයි 31 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ඇ) 2014 නොවැම්බර් මස රාජ්‍ය නිලධාරීන් ඉල්ලුම් කර භාර නොගත් හිමිකම් නොපෑ වාර ප්‍රවේශපත්‍ර 35 ක් නැවත භාවිතා කළ නොහැකි පරිදි අවලංගු කර නොතිබුණි. එහි වටිනාකම රු.34,290 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය. එම ප්‍රවේශපත්‍ර අවලංගු කිරීමේ ක්‍රියාවලියේ විවිධ අක්‍රමිකතාවයන්ට ඉඩ තිබෙන බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයේදී නුගේගොඩ දුම්රිය ස්ථාන පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන වෙළඳ සැල් වෙනුවෙන් අයවිය යුතු බදු කුලී මුදල රු.2,713,912 ක් විය. එය 2013 හා ඊට පෙර වර්ෂය වෙනුවෙන් රු.439,535 ක්ද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.2,274,377 ක්ද විය. එම බදු ගිවිසුම් වසර 05 ක් ඉක්මවූ ඒවා වූ අතර ඒ සඳහා නව බදු ගිවිසුම්වලට එළැඹීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේ ජනවාරි මාසයේ සිට 2014 ජූලි මාසය දක්වා වූ බැංකු ප්‍රකාශවල සඳහන්ව තිබුණු බැංකු වැරදි බැර පොලී රු.15,967 ක් 2015 මැයි 31 දින වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) පාලන ක්‍රමයේ පැවැති දුර්වලතා නිසා සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසය වෙනුවෙන් එක් පුද්ගලයෙකුට කුරුණෑගල සිට කොළඹ කොටුව දක්වා වූ රු.770 ක් වටිනා ත්‍රෛමාසික වාර ප්‍රවේශපත්‍රයක්ද, රු.2,310 ක් හා රු.4,320 ක් වටිනා ත්‍රෛමාසික වාර ප්‍රවේශපත්‍ර 02 ක්ද, වශයෙන් ප්‍රවේශපත්‍ර 03 ක් දෙපාර්තමේන්තුවේ වාර ප්‍රවේශපත්‍ර ශාඛාව විසින් කළ දැණුම්දීමක් අනුව කුරුණෑගල දුම්රිය ස්ථානාධිපති විසින් නිකුත් කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ දුම්රිය සාමාන්‍යාධිකාරිගේ රැස් කිරීම් ගිණුමට සෘජු බැර කිරීම් ලෙස රු.101,737,860 ක් කර තිබුණු අතර එම මුදල නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඍ) මූලස්ථාන ප්‍රවේශපත්‍ර සැපයීම් අංශය මගින් කොට්ටාව දුම්රිය ස්ථානය වෙත කොට්ටාව - නාරහේන්පිට III පන්තිය මුද්‍රණය කළ එකම කාණ්ඩ අංක සහිත මුද්‍රිත ප්‍රවේශපත්‍ර එකම ගමනාන්තයක් වෙනුවෙන් පෙර නිකුත් කළ ප්‍රවේශපත්‍ර අවසන් වීමට ප්‍රථම දිගින් දිගටම එම දුම්රිය ස්ථාන වෙත සැපයීම කර තිබුණි. දුම්රිය ස්ථානාධිපති භාවිතා කරන තොගය එසේ ලැබූ කුමන තොග කාණ්ඩයට අයත් දැයි යන්න විගණනයේදී සනාථ කර ගත නොහැකි වූ අතර විවිධ අක්‍රමිකතා ඇති වීමේ අවස්ථා පැවැතිය හැකි බව විගණනයේදී තව දුරටත් නිරීක්ෂණය විය.

(එ) අනු අංක 1000 සිට 1499 දක්වා වූ හෝමාගම නුගේගොඩ 3 පන්තිය මුද්‍රිත වාර ප්‍රවේශපත්‍ර 500 ක නියමිත ගමන් ගාස්තුව වූ රු.360 ක් වෙනුවට රු.480 ක් ලෙස මුද්‍රණය කර හෝමාගම දුම්රිය ස්ථානය වෙත සපයා තිබුණි. නියමිත ගාස්තුවට වඩා රු.120 ක අධි ගාස්තුවක් සහිතව මුද්‍රණය කිරීම නිසා දුම්රිය ස්ථානාධිපතිවරුන්ට අධි ගාස්තු අය කිරීමේ අවස්ථා හිමිකර දී තිබුණි.

(ඒ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුව (ඉහල) උප දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය ස්ථාන 07 ක නිවාස 108 ක් ආයතනය සකස් කළ නිවාස ලේඛනයට ඇතුළත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඔ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග, කර්මාන්ත සහ ප්‍රවාහන උප දෙපාර්තමේන්තුවට අයත් නිවාස 14 ක අනවසර පදිංචි කරුවන් සිටින බව නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

(ඕ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග, කර්මාන්ත සහ ප්‍රවාහන උප දෙපාර්තමේන්තුවට අයත් නිවාස 08 ක් පදිංචියට නුසුදුසු බැවින් එම නිවාස සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ක) 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ගබඩා භාණ්ඩ තොග සමීක්ෂණයේදී නිරීක්ෂණය වූ රු.1,140,466 ක් වටිනා අතිරික්ත තොග අයිතම 51 ක් සහ රු. 60,110,208 ක් වටිනා ඌන තොග අයිතම 938 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඛ) දුම්රිය ස්ථානාධිපතිවරු වෙත ප්‍රවේශපත්‍ර ආදායම් ලෙස ලැබී තිබූ මුදල් නියමිත දිනට ප්‍රධාන ගණකාධිකාරී වෙත ප්රේෂණය කළ යුතු වුවත්, දුම්රිය ස්ථාන පොදු ගිණුම අනුව නිලධාරීන් 04 දෙනෙකුගෙන් ප්‍රේෂණය කළ යුතු රු.52,942 ක මුදල් වර්ෂ ගනනාවක සිට ප්‍රේෂණය නොකිරීම සම්බන්ධයෙන් ඔවුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

(ග) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විවිධ සේවා සමූපකාර සමිතියකට බදු දී තිබූ ගොඩනැගිලි, දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව නවීකරනය කර නව සාප්පු සංකීර්ණයක් බවට පත් කර තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් ඔවුන් විසින් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට තිබූ මුදල රු. 4,373,645 ක් විය. එම හිඟ බදු මුදල නොගෙවා තිබියදී එම ගොඩනැගිලි කඩ කාමර බාහිර පුද්ගලයින් 10 දෙනෙකු වෙත උප බදු දී රු.926,000 ක් තැන්පතු ලෙස තබා ගෙන රු.45,650 ක් පමණ මුදලක් මාසිකව අයකරන බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඝ) උකුවෙල දුම්රිය ස්ථානය ආසන්නයෙන්ම අනවසර පිවිසුම් මාර්ග ඉදිකර උකුවෙල ධාවනාගාර නිල නිවාසය සහ භූමිය දිගු කලක සිට පෞද්ගලික පාර්ශවයක් විසින් අනවසර පරිහරණයක් සිදු කරන බව නිරීක්ෂණය විය. ඒ සඳහා කිසිදු ගිවිසුමක් නොමැති අතර ගාස්තුවක්ද, අය කර නොතිබුණි.

(ච) වත්තේගම සමූපකාර සමිතිය වෙත බදු දී තිබුණු ඉඩම් වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට හිඟ බදු ලෙස රු.709,143 ක් අය කර යුතුව තිබුණු අතර එම ගොඩනැගිලි අනවසරයෙන් විවිධ වෙනස්කම් සිදු කරමින් වෙනත් පාර්ශව 10 ක ට උප බදු ලෙස ලබා දෙමින් මසකට රු 156,000 ක් පමණ මුදලක් එම සමිතිය උපයන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ජ) මාතලේ දිස්ත්‍රික්කයේ බදු ලිපි ගොනු 78 ක් පරීක්ෂාවේදී හා එම ප්‍රදේශයේ පිහිටි බදු ඉඩම් කිහිපයක් සම්බන්ධයෙන් කළ ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී බොහෝ ඉඩම් අනවසර පරිහරණයක් සිදු කර ඇති බව අනාවරණය විය. 2013 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 5.1 ක හිඟ බදු ආදායමක් ලැබිය යුතුව තිබූ අතර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඣ) පලෙයි සිට කන්කසන්තුරය දක්වා දුම්රිය ඉදි කිරීමේ ව්‍යාපෘතිය 2014 ජූනි 13 දින අවසන් කර භාරදිය යුතු වුවත්, 2014 සැප්තැම්බර් 03 දින වන විටත් අවසන් කර හෝ දින දීර්ඝ කිරීමක් කර නොතිබුණි. මාවට්ටපුරම් සිට කන්කසන්තුරය දක්වා වූ හමුදා අධි ආරක්ෂිත කලාපයේ කි.මී. 02 ක ප්‍රමාණයක ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් කිරීමේ ප්‍රමාදය පිළිබඳ නිසි කළමණාකරණ තීරණ ගෙන නොතිබුණි. මෙයට අමතරව පස් හා බොරළු සැපයීමේ වගකීම නිසි පරිදි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ඉටු නොකිරීම හේතුවෙන් මාස 08 ක පමණ ප්‍රමාදයක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

( ඤා) ව්‍යාපෘතියේ අධි ඇස්තමේන්තු කිරීම නිසා රු. 374,189,504 ක රේල්පීලි සහ සිල්පර ඉතුරු වී තිබුණි. ඒ සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගේ පිළිතුර වූයේ ඒ ඒ පවතින මාර්ගය

නවීකරණයට විකල්ප භාවිතයක් හඳුනාගෙන ඇති බවයි. නමුත් ඒවා 2015 මැයි 31 දින වන විටත් හඳුනාගත් විකල්ප සඳහා භාවිතා කර නොතිබුණු අතර ව්‍යාපෘති අවසන් කර තිබුණද, මාස 09 කට ආසන්න කාලයක් මසකට රු.300,000 ක් වැය කරමින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සේවය ලබා ගෙන තිබුණි.

(ණ) සංඥා හා විදුලි සංදේශ ව්‍යාපෘතිය 2014 මැයි 30 දින වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණු නමුත් ප්‍රමාණ පත්‍රයේ වර්ග මීටර් 600 ක් වෙනුවෙන් ඇ.ඩො.388,800 ක් උපකරණ කාමර සඳහා ගේට්ටු ඉදි කිරීම 2014 ජූනි මාසය අවසන් වන විටද ආරම්භ කර නොතිබුණි.

(ත) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ආදායම් ලෙස ලැබී තිබුණු රු.1,679,491 ක වටිනාකමකින් යුත් චෙක්පත් 26 ක් අගරු වී තිබුණි. එම චෙක්පත්වල හිඟ හිටි කාල සීමාව වර්ෂ 02 ක සිට වර්ෂ 10 ක් දක්වා කාලයක් තුළ පැවති අතර එම මුදල් අයකර ගැනීමේ හැකියාව සොයාබලා නොතිබුණි.

(ද) වර්ෂ 20 කට අධික කාලයක සිට බාහිර ආයතන වෙනුවෙන් පවත්වනු ලබන ලෙජරයන්වල සඳහන් බලපත්‍ර ආදායමේ හිඟ ශේෂයන් නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එම හේතුවෙන් ආයතන 59 කින් දෙපාර්තමේන්තුවට ලැබිය යුතු රු.3,475,599 ක ආදායම් 2014 නොවැම්බර් 30 දින වන විටත් හිඟ ශේෂ ලෙස ලෙජරයන්හි දක්වා තිබුණි.

(ධ) දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කර විශ්‍රාම ගිය හා මියගිය පුද්ගලයින්ට ගෙවිය යුතු පාරිතෝෂික මුදල් ගෙවීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති රු.645,819 ක් වටිනා චෙක්පත් 11 ක් අදාල පුද්ගලයන්ට භාර දීමට කටයුතු නොකර වර්ෂ දෙකකට අධික කාලයක් දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමේ රඳවා තිබුණි.

(න) සංඥා පද්ධති ස්ථාපිත කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයකින් හා විස්තරාත්මක අධ්‍යයනයකින් තොරව ඇස්තමේන්තු සැකසීම නිසා අනුරාධපුර පලෙයි මැදවච්චිය සිට තලෙයිමන්නාරම් කොටසේ හා පලෙයි සිට කන්කසන්තුරේ කොටසේ පිළිවෙලින් ප්‍රමාණ පත්‍රයේ අයිතම් 17 හා අයිතම් 09 වෙනුවෙන් ඇ.ඩො. මිලියන 2.43 ක් හා ඇ.ඩො. 756,628 ක් 2014 ජූනි මාසය වන විට කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. සමහර අයිතමයන් ඇස්තමේන්තු වටිනාකම සියයට 50 ඉක්මවා තිබුණුද, එම ඉක්මවීම සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඩ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් උප දෙපාර්තමේන්තු 05 කට අදාල නිල නිවාස 1024 ක් කිසිදු නිලධාරියකු පදිංචි නොවී හිස්ව තිබුණි.

(ප) දුම්රිය ශ්‍රවණාගාරය හා මවුන්ට්මේරි ක්‍රීඩාංගනය ආරම්භයේ සිට කුලියට දීමෙන් ලැබෙන ආදායම රාජ්‍ය ආදායමට බැර නොකර දුම්රිය සාහිත්‍ය හා සාමාජ ආයතන ගිණුමට බැර කර තිබුණි.

## 4.20 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 212 | 119 | 93 | **--** |
| **(ii)** | තෘතියික මට්ටම | 464 | 189 | 275 | -- |
| **(iii)** | ද්විතියික මට්ටම | 7,274 | 4,864 | 2,410 | -- |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 12,386 | 10,133 | 2,253 | -- |
| **(v)** | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | -- | 1,588 | -- | 1,588 |
| | එකතුව | **20,336** | **16,893** | **5,031** | **1,588** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 5,031 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

---

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| **(i)** | දිස්ත්‍රික් විදුලි පරීක්ෂක | 01 | ප්‍රවාහන අමාත්‍යාංශය | 2014 අගෝස්තු මාසයේ සිට |
| **(ii)** | දිස්ත්‍රික් ප්‍රවාහන පරීක්ෂක | 01 | - එම - | - එම - |
| **(iii)** | තාක්ෂණ ශිල්පී සහායක (බහුකාරය) | 05 | - එම - | 2014 දෙසැම්බර් මාසයේ සිට |
| **(iv)** | තාක්ෂණ ශිල්පී සහායක | 04 | ශ්‍රී ලංකා පාබල හමුදා, ස්වේච්ඡා බල සේනාවේ වොලිබෝල් කණ්ඩායම් සඳහා | 2014 අප්‍රේල් 28 දින සිට |
| **(v)** | මෝටර් රථ රියදුරු | 01 | ප්‍රවාහන අමාත්‍යාංශය | 2014 නොවැම්බර් 03 දින සිට |
| **(vi)** | රාජ්‍ය කළමණාකරන සහකාර | 01 | - එම - | 2014 ඔක්තෝබර් 20 දින සිට |

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

---

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ආහාර දෙපාර්තමේන්තුවේ වාප්පු ක්ෂේත්‍ර නිලධාරීන් දෙදෙනෙකු 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සේවයේ යොදවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඈ) විශ්‍රාමිකයන් නැවත සේවයේ යෙදවීම.**

---

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පියවීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම ලබා තිබෙන නිලධාරීන් නැවත සේවයේ යොදවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| දුම්රිය එන්ජින් රියදුරු | 10 |
| දුම්රිය නියාමක | 48 |
| දුම්රිය ස්ථානාධිපති | 10 |

| | |
|---|---|
| දුම්රිය අධීක්ෂණ කළමණාකරන සේවය | 25 |
| ගමනා ගමන අධිකාරී | 01 |
| සහකාර දුම්රිය ගබඩා අධිකාරී | 01 |
| මූලික තාක්ෂණ ශිල්පී (පරිපාලන) | 02 |
| තාක්ෂණ ශිල්පී (විදුලි වැද්දුම්කරු) | 01 |
| කාලගණක ලිපිකරු | 04 |

## 5. ශීර්ෂ 307 - මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 5.1 විගණන සාක්ෂි නොවීම

2013 පෙබරවාරි මාසයේ සිට 2015 ඔක්තෝබර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ විගණන විමසුම් / තොරතුරු කැඳවීම් ලිපි 13 ක් මගින් ඉල්ලා තිබුණු වාහන / යතුරු පැදි 597 ක්, 31, 32, 60, 61, 62, 64 හා 65 යන අංක කාණ්ඩ යටතේ සහ G, H, J ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ ලියාපදිංචි කර ඇති සියළුම වාහනවල තොරතුරු, ලිපිගොනු හා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ලබා දී නොතිබුණි. සමහර තොරතුරු බොහෝ ප්‍රමාද කර ඉදිරිපත් කිරීම නිසා එය විගණනයට බාධාවක් වී තිබුණි.

### 5.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 07 කට එවා තිබුණු පිළිතුරු සළකා බැලීමෙන් පසු පැහැදිලි නොවූ, අසම්පූර්ණ සහ පිළිගත නොහැකි පිළිතුරු ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම් 5 ක් සම්බන්ධයෙන් නැවත විගණන විමසුමක් නිකුත් කර තිබුණි. එම විගණන විමසුම සඳහා 2015 ඔක්තෝබර් 31 දින වන විටද පිළිතුරු එවා නොතිබුණි.

### 5.3 විසර්ජන ගිණුම

#### 5.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් දෙකක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 52 ක සිට සියයට 70 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් දෙකක් සඳහා සළසා ගෙන තිබුණු එකතුව රු.300,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන්වලට මාරු කර තිබුණි.

(ඇ) 307-2-1-11-1405 වැය විෂය යටතේ වායු දූෂක නිකුත් කිරීමේ පරීක්ෂාව සඳහා රු.200,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව එම මුළු ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන්වලට මාරු කර තිබුණි. වායු දූෂක පරීක්ෂණ සඳහා වෙනම අරමුදලක්, දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මකව තිබියදීත්, වායු දූෂක නිකුත්වීම් පරීක්ෂාව සඳහා වෙනම වැය විෂයයක් යටතේ ප්‍රතිපාදන සළසා ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුමේ සටහන (i) - "ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ" 307-2-1-2101 වැය විෂය යටතේ 2014 වර්ෂයේ එකතු කිරීම් ලෙස රු.371,915 ක් දක්වා තිබුණි. නමුත් 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව එම වැය විෂය යටතේ ප්‍රතිපාදන සළසා නොතිබුණි.

**5.4 පොදු තැන්පත් ගිණුම**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 280,346,778 ක් වූ තැන්පතු 87 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) අංක.6000/0000/00/0003/0159 දරන පොදු තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂයන්ගේ රු.186,575 ක වෙනසක් පැවතුණි.

**5.5 ආදායම් ගිණුම්**

**---------------**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාට ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 03 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 10.03.01.00 දරන ආදායම් සංකේතය - සුඛෝපභෝගී මෝටර් වාහන බදු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ආදායම් ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා**

සමාලෝචිත වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.1,020,000,000 ක් වූ අතර වර්ෂයේ රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම රු.1,114,853,639 ක් එනම් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා රු.94,853,639 ක හෙවත් සියයට 09 ක වැඩිවීමකි. මේ අනුව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම තාත්ත්වික හා නිවැරදි ලෙස සිදුකර නොතිබුණි.

**(ii) හිඟ ආදායම් ලේඛන නොපැවැත්වීම සහ හිඟ ආදායම් සම්බන්ධයෙන් වාර්තා නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දෙපාර්තමේන්තුව විසින් 1995 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා විධිමත් ලෙස ආදායම් ලේඛන පවත්වා නොතිබුණු බැවින් ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද අයවිය යුතු හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
- මුදල් රෙගුලාසි 128 (2)(ඇ) ප්‍රකාරව සහ 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 08 ඡේදය පරිදි හිඟ ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද දෙපාර්තමේන්තුව විසින් හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
- මුදල් රෙගුලාසි 176(2) ප්‍රකාරව, ලැබිය යුතුව තිබෙන යම්කිසි මුදල් ගණනක් අප්‍රමාදව එකතු කර ගෙන විධිමත් වූ පරිදි ඒ පිළිබඳව ගණන් පෙන්වීමට යම්කිසි ආදායම් ගණන් දීමේ නිලධාරියකු අපොහොසත් වේ නම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් ඒ බව භාණ්ඩාගාරයේ ලේකම්ට වාර්තා කළ යුතු වුවත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි.

**(iii) ආදායම් තත්ත්වයන් සමාලෝචනය නොකිරීම**

2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 03 හා 05 ඡේදවල සඳහන් පරිදි ආදායම් තත්ත්වයන් ඇස්තමේන්තු කිරීම් හා කළින් කලට ආදායම් තත්ත්වයන් අඛන්ඩව සමාලෝචනය හා අධීක්ෂණය විධිමත් පරිදි සිදු කිරීම ආදායම් ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වුවත්, ආදායම් ගණන්දීමේ නිලධාරී විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

**(iv) මෝටර් වාහන සම්බන්ධ සුඛෝපභෝගි බදු ලේඛන ගත කිරීම**

සුඛෝපභෝගී බදු අයවන මෝටර් වාහන සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන ලේඛනය යාවත්කාලීන නොකිරීම නිසා හිඟ ආදායම කොපමණද යන්න ගණනය කළ නොහැකි වී තිබුණි. එම නිසා ඩී.ජී.එස්.ඒ ආදායම් - 2 ආකෘතියේ අංක 08 සිට 14 දක්වා වූ තීරුවල වටිනාකම් "නැත" යන්න ලෙස සඳහන් කර ආදායම් ගිණුම පිළියෙල කර තිබුණි.

**(ආ) 10-03-07-04 දරන ආදායම් සංකේතය - මෝටර් වාහන විකිණීම මත බදු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා**

සමාලෝචිත වර්ෂය සඳහා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.68,000,000 ක් වූ අතර වර්ෂයේ රැස්කර තිබූ ශුද්ධ ආදායම රු.51,935,758 ක් හෙවත් සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 76 ක් විය. මේ අනුව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම තාත්ත්වික හා නිවැරදි ලෙස සිදුකර නොතිබුණි.

**(ii) හිඟ ආදායම් සම්බන්ධයෙන් වාර්තා නොකිරීම**

මුදල් රෙගුලාසි 128 (2) (ඇ) ප්‍රකාරව නියම කර ඇති පරිදි 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 08 ඡේදය පරිදි හිඟ ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා එම කාලසීමාව අවසන්වීමෙන් පසුව එළඹෙන මාසය ඇතුළත රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත්

කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා හෝ හිඟ ආදායම් නොමැතිනම් හිස් වාර්තාවක් හෝ එවා නොතිබුණි.

**(ඇ) 20.03.02.14 දරන ආදායම් සංකේතය - මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරනු ලබන ගාස්තු හා අනිකුත් ලැබීම්**

සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේතට අදාලව මුලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව පිළිවෙලින් රු.7,450,000,000 ක් හා රු.7,600,000,000 ක් වුවත්, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව, විගණනයට ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුමේ සඳහන් කර නොතිබුණි.

## 5.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 30701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,133,262 ක්වූ අතර, වර්ෂ 02 සිට වර්ෂ 26 ක් දක්වා කාල පරාසයක සිට එම හිඟහිටි ශේෂ පැවැත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවැතුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 03 ක සිට 20 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකරන ලද මියගිය හා විශ්රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.747,716 ක් වි තිබුණි.

(ii) විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු අය විය යුතු ණය ශේෂය රු.670,563 ක් විය.

(iii) වර්ෂ 02 ක සිට වර්ෂ 26 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකරන ලද වැඩ තහනමට ලක්ව සිටින නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.1,054,806 ක් වි තිබුණි.

(iv) වර්ෂ 13 කට වැඩි වර්ෂ 21 කට අඩු කාල පරාසයක සිට පැවත එන නිරවුල් නොකරන ලද සේවය හැර ගිය හා සේවයෙන් පහකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.185,388 ක් වි තිබුණි.

(v) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව සහ පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය අතර වු වෙනස හඳුනා නොගෙන දිගින් දිගටම වර්ධනය වන ප්‍රවණතාවයන් පැවතුණි. තවද 2013 වර්ෂයේදී රු.2,177,500 ක්ව පැවති නොසැසඳුණු ශේෂය 2014 වර්ෂයේදී රු.2,637,566 ක් දක්වා වර්ධනය වීම හේතුවෙන් හිතාමතා හෝ වැරදීමකින් සේවක ණය ශේෂයන් ණය ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා හෝ අඩුවෙන් දැක්වීම සඳහා අවදානමක් පැවැතුණි.

## 5.7 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුද්‍රණ යන්ත්‍ර ( Mobile Smart Term ) 10 ක් අවුරුදු 06 කට අධික කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2004 වර්ෂයේ ජර්මනියේ JTZ ආයතනයෙන් ත්‍යාග වශයෙන් ලැබී තිබුණු යන්ත්‍ර තොගයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. එම යන්ත්‍රවල වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

## 5.8 අනුකූල නොවීම්

---

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| (i) 2009 අංක 08 දරන මෝටර් වාහන සංශෝධන පනත | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතියක් නොමැතිව කිසිදු අවස්ථාවක වාහනයක් සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අළුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ එහි වෙනත් නිර්මාණය කිරීම් නොකළ යුතු වුවද, ඊට පටහැනිව මෝටර් වාහන පරිවර්තනය කිරීම් කර තිබුණි. |
| (ii) 2009 අංක 08 දරන මෝටර් වාහන සංශෝධන පනතේ 124 (අ) වගන්තිය | දෙපාර්තමේන්තුව විසින් "රියදුරු බලපත්‍ර අරමුදලක්" පිහිටු විය යුතු බවත්, 2 වන උප වගන්තියට අනුව රියදුරු බලපත්‍ර කාඩ්පත ලබා ගැනීම සඳහා ගෙවනු ලබන නියමිත ගාස්තුවෙන් යම් කොටසක් මෙම අරමුදලට බැර කළ යුතු බව සඳහන් වුවද, දෙපාර්තමේන්තුව විසින් එවැනි අරමුදලක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 85(2) ආ | ආදායම් ඇස්තමේන්තු වෙනස් කිරීමට අවශ්‍ය වන්නේනම් ඒ බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඊට හේතු සහිතව ඒ බව ආර්ථික කටයුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත |

| | | |
|---|---|---|
| | | වාර්තා කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේදී එසේ සිදුකර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 447 | සෑම මාසයක් අවසානයේදී වැය ලෙජරය තුලනය කර නොතිබුණි. . |
| (iii) | මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාරයේ පවත්නා නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. |

**5.9 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(i) වාහනවල අයිතිය පැවරුම් කිරීම ප්‍රමාණවත් පරිදි ඉටු නොකිරීම**

මෝටර් රථ පනතේ 12 (3)(අ) වගන්තියේ විධිවිධාන අනුව වාහනවල අයිතිය වෙනස් කිරීම් අදාල වාහනවල අයිතිකරුවන් විසින් ඉටු නොකළ අවස්ථාවලදී දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකාරී වී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

**(ii) සුඛෝපභෝගී බදු අයකර ගැනීමේදී ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- හිඟ ආදායම් පිළිබඳව වාර්තා නොකිරීම සහ හිඟ ආදායම් එකතු කර ගැනීම දුර්වල මට්ටමක පැවැතුණි.

- 1995 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල බදු මුදල් අයකිරීම හා ලැබිය යුතු බදු මුදල් පිළිබඳව ක්‍රමවත්ව වාර්තා තබා ගෙන නොතිබුණි.
- ආදායම් පාලන ගිණුම් පවත්වා නොතිබුණි.
- බදු අයකර ගැනීමේ කටයුතු නිසි පරිදි ඉටු නොකරන ලද රක්ෂණ ආයතන සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
- බදු ගෙවීම් පැහැර හරිනු ලබන වාහන හිමියන් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කර නොතිබුණි.
- සුබෝපභෝගී බදු කුවිතාන්සි පොත් එක් එක් රක්ෂණ ආයතනයට නිකුත් කිරීම් හා ආපසු ලැබීම් පිළිබඳව විධිමත්ව හඳුනාගත හැකි ආකාරයට උප පත්‍රිකා ලේඛනය යාවත්කාලීන කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(iii) වාහන නව ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්**

**---------------------------------------------------------------------------------**

දෙපාර්තමේන්තුව තුළ සිදුවන වංචනික කටයුතු පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත දිගින් දිගටම විගණන විමසුම් කිහිපයක් මඟින්ම පෙන්වා දී තිබුණද, එම වංචනික කටයුතු සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණ සිදු කර, ඒ සම්බන්ධව මැදිහත්ව ක්‍රියාකරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම සහ එම වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම ඇතුළු වාහන හිමිකරුවන් සම්බන්ධයෙන් මෝටර් වාහන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(iv) මෝටර් වාහන පනතේ 18 වගන්තියේ විධිවිධාන අනුව කළ යුතු කාර්යභාර්යන් ඉටුකර නොතිබීම**

**--------------------------------------------------------------------------**

මෝටර් වාහන පනතේ 18 වගන්තියේ දක්වා ඇති විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු කාර්යයභාරය ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ අවස්ථා පහත දැක්වේ.

- අනතුරකට පත් වී හෝ වෙනත් ලෙසකින් සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලද වාහන සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

- අවලංගු කරන ලද මෝටර් වාහන පිළිබඳව ලේඛනයක් පවත්වා නොතිබුණි.
- අඛණ්ඩව අවුරුදු දෙකකට වඩා වැඩි කාලයකට අදාලව ආදායම් බලපත්‍ර ලබා නොගත් වාහන සම්බන්ධයෙන් මෝටර් වාහන පනතට අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
- සුනාමි, ත්‍රස්තවාදී ව්‍යවසනයන් ඇතුළු ස්වභාවික හා ස්වභාවික නොවන කරුණු හේතුවෙන් බොහෝ වාහන විනාශ වී තිබුණද, එකී වාහන සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කර නොතිබුණි.
- දිවයින තුළ සත්‍ය වශයෙන්ම ධාවනය කරනු ලබන වාහන පිළිබඳව සංඛ්‍යාත්මක තොරතුරු හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වා නොතිබුණි.

**(v) වාහනවල මුල් ලිපිගොනු ආරක්ෂා නොකිරීම**

---

දෙපාර්තමේන්තුවේ දෛනික ලියාපදිංචි කරනු ලබන වාහනවල මුල් ලිපිගොනු ආරක්ෂා කර තබා ගැනීම දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු අත්‍යවශ්‍ය වූ කාර්යභාර්යක් වුවද, වාහනවල මුල් ලිපිගොනු විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තු භාරයේ නොමැතිවීම හා අතුරුදහන් වී ඇති බැවින් එකී අත්‍යවශ්‍ය වූ කාර්යභාර්ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි.

**(vi) කාලීනව ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල ලියාපදිංචිය අවලංගු නොකිරීම**

---

දෙපාර්තමේන්තුව විසින් කාලීනව ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කිරීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල අංකයන් යොදා ගනිමින් රේගු බදු නොගෙවා නීතිවිරෝධී ලෙස ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනවල දත්ත මෙම වාහන අංකවලට ඇතුළත් කරමින් හෝ මෙම වාහන හඳුනාගැනීමේ අංකය යොදා ගනිමින් අක්‍රමිකතාවයන් රාශියක් සිදු කිරීමට ඉඩකඩ ලැබී තිබුණි. ඒ හේතුවෙන් වංචනික වාහන ලියාපදිංචිය තවදුරටත් ඉහලයාම සහ වාහන බදු ආදායම ප්‍රමාණවත් ලෙස අඩුවීමටත් හේතු වී තිබුණි.

**(vii) වංචනිකව පරිවර්තනය කරනු ලැබූ වාහන නිත්‍යානුකූල තත්ත්වයට පත්කර ගැනිම**

---

වංචනිකව පරිවර්තනය කරනු ලැබූ වාහන නිත්‍යානුකූල තත්ත්වයට පත්කර ගැනීමේ 2012 ඔක්තෝබර් 16 දිනැති අංක 12/1490/538/036 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය හා 2013 ජනවාරි 03 දිනැති අදාල අනුමැතිය පරිදි 2013 මාර්තු 31 දිනෙන් පසුව මෙලෙස පරිවර්තනය කළ මෝටර් රථ ලියාපදිංචියට ඉඩ දීම සිදු නොකළ යුතුව තිබුණි. එම දිනෙන් පසු ලියාපදිංචි නොකළ පරිවර්තන රථ පරිහරණය කරන පුද්ගලයන්ට එරෙහිව නීති මඟින් කටයුතු කළ යුතු බව අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් වුවද, නීති විරෝධි ලෙස පරිවර්තනය කරන ලද මෝටර් රථ සුලභව පරිහරණය කර තිබුණත්, එකී පුද්ගලයන් සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කර නොතිබුණි.

**(viii) නීතියට පටහැනිව පරිවර්තනයන් කළ වාහන පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.**

---

මාර්ගයේ ධාවනය වන වාහන පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවේදී පරිවර්තනයන් සිදුකරන ලද වාහන 26 ක් පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයාට පෙන්වා දී තිබුණි. ඊට අමතරව තවත් විශාල පරිවර්තනය කළ වාහන ප්‍රමාණයක් නිරීක්ෂණය කළ හැකි වුවද, මෝටර් රථ පනතට අනුව එවැනි වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම, වාර්ෂික වාහන ආදායම් බලපත්‍ර නිකුත් නොකිරීමට කටයුතු කිරීම හා එම වාහන පිළිබඳව විස්තර ශ්‍රී ලංකා පොලිසිය හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුවත් කිරීම ඇතුළු ඉතා පහසුවෙන් ඉටුකළ හැකි කාර්යභාර්යයන් කිසිවක් දෙපාර්තමේන්තුව විසින් ඉටුකර නොතිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

---

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

---

දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව විද්‍යුත් රථ වාහන පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු. 150,000,000 ප්‍රතිපාදන සළසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී මේ සම්බන්ධයෙන් කිසිදු වියදමක් කර නොතිබුණි.

## 5.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වෙළඳ වාහන නව ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ හා රේගු දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ රේගු සටහන් කර අංකයන් (Custom Entry Number) අතර අවස්ථා 06 ක දී වෙනස්කම් පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ට්‍රක් රථයක් ලෙස ලියාපදිංචිකර තිබුණ වාහනයක් ලැන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් මාදිලියේ ඩබල් කැබ් රථයක් ලෙසද, දෙපාර්තමේන්තුවේ සිංගල් කැබ් රථයක් ලෙස ලියාපදිංචි කර තිබුණ වාහනය ක් ලැන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් වර්ගයේ ඩබල් කැබ් රථයක් ලෙසද, පරිවර්තනය කර තිබුණි.

(ඇ) එකම මාදිලියේ මිට්ෂුබිෂි වෑන් (Mitsubishi Van) රථ දෙකක් KU හා PG අකුරු කාණ්ඩ දරන වාහන පන්ති දෙකක් යටතේ මෝටර් කාර් සහ ද්විත්ව කාර්යය වාහන ලෙස ලියාපදිංචි කර තිබුණි. එසේම, භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආනයනය කර තිබූ වෑන් රථයක් KN අකුරු ඛාණ්ඩය යටතේ මෝටර් කාර් රථයක් ලෙස ලියාපදිංචි කර තිබුණි.

(ඈ) "PP" සහ "PX" දක්වා වාහන හඳුනාගැනීමේ ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ ලියාපදිංචි කර තිබූ ද්විත්ව කාර්යය සිංගල් කැබ් රථ 18 ක් සුඛෝපභෝගී මෝටර් රථ බවට පරිවර්තනය කර තිබුණි.

(ඉ) වංචනික ලෙස ලියාපදිංචි කිරීමේ අරමුණින් යතුරු පැදි 141ක් පමණක් ආනයනය කරන ලද රේගු සටහන්කර 85කින් යතුරු පැදි 2577ක් ආනයනය කළ ලෙසද කිසිදු යතුරු පැදියක් ආනයනය නොකළ රේගු සටහන්කර 7කින් යතුරු පැදි 2098ක් ආනයනය කළ ලෙසද දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණි.

(ඊ) නීති විරෝධී ලෙස ආනයනය කරන ලද හෝ කොටස් එකලස් කර සකසන ලද යතුරු පැදි විශාල ප්‍රමාණයක් දිනපතා වංචනික ලෙස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම මගින් රජයට විශාල බදු ආදායමක් අහිමි කර තිබුණු අතර 2014 ජුනි මාසයේ දින 05ක් තුළදී පමණක් එවැනි ලියාපදිංචි කිරීම් 108ක් සිදුකර තිබුණි.

(උ) K අක්ෂරය දරන වාහන හඳුනා ගැනීමේ අකුරු කාණ්ඩ යටතේ ලියාපදිංචි කළ යුතු මෝටර් කාර් රථ 13 ක් දෙපාර්තමේන්තුව විසින් "PP" සිට "PY" දක්වා වූ වාහන හඳුනා ගැනීමේ අකුරු කාණ්ඩ යටතේ ද්විත්ව කාර්යය සිංගල් කැබ් රථ ලෙස ලියාපදිංචි කර තිබුණි.

(ඌ) K අක්ෂරය දරන වාහන හඳුනා ගැනීමේ අකුරු කාණ්ඩ යටතේ ලියාපදිංචි කළ යුතු මෝටර් කාර් රථ 4 ක් "PA" සිට "PM" වාහන හඳුනා ගැනීමේ අකුරු කාණ්ඩ යටතේ ඩබල් කැබ් රථ හා වෑන් රථ ලෙස ලියාපදිංචි කර තිබුණි.

(එ) K අක්ෂරය දරන වාහන හඳුනා ගැනීමේ අකුරු කාණ්ඩ යටතේ ලියාපදිංචි කළ යුතු මෝටර් කාර් රථ 04 ක් "L" අකුරු කාණ්ඩය යටතේ මෝටර් ලොරි ලෙස ලියාපදිංචි කර තිබුණි.

(ඒ) මෝටර් සයිකල් හා විවිධ භාණ්ඩ වර්ගයන් ආනයනය කර තිබුණු රේගු ආනයන සටහන්කර වංචනික ලෙස උපයෝගී කර ගනිමින් B.M.W, ටොයොටා, ප්‍රාඩෝ, මර්සිඩීස් බෙන්ස් ඇතුළු අධි සුඛෝපභෝගී මෝටර් රථ 10 ක් සහ වෙනත් වර්ගවල මෝටර් වාහන 26 ක් ලියාපදිංචි කර තිබුණි.

(ඔ) ජංගම අක්ෂි සායන වෑන් (Mobile Eye clinic van), ජංගම වැඩමුළු වෑන් (Mobile work shop van) ලෙස විශේෂිත අරමුණු සඳහා ආනයනය කළ වාහන ආනයනකරුවන් විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ආනයන ලියකියවිලි සමඟ ඉදිරිපත් කිරීමේදී ඒවා රියදුරු කුඩුව හැර වාහනයේ ඉතිරි කොටස සම්පූර්ණයෙන්ම අදාල විශේෂිත අරමුණු සඳහා සකස් කර ඇති බවට ප්‍රකාශ කර රේගු බද්ද අඩුවෙන් ගෙවා නිදහස් කර ගෙන තිබුණි. එකී වෑන් රථ ආසන ප්‍රමාණය 05 ක් සහ 07 ක් ලෙස සඳහන් කර ද්විත්ව කාර්යය වාහන ලෙස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල අවස්ථා 22 ක් පැවතුණි.

## 5.11 මුල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) PV සහ PR ඉංග්‍රීසි අකුරු කාණ්ඩ යටතේ පිළිවෙලින් ට්‍රක් රථයක් සහ සිංගල් කැබ් රථයක් ලෙස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ වාහන භෞතික පරීක්ෂාවේදී ලෑන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් මාදිලියේ ඩබල් කැබ් රථ බව නිරීක්ෂණය විය. මෙම වාහන අඩු රේගු බදු ගෙවිය යුතු රේගු සංයෝජිත අංකය යටතේ විශේෂ කාර්යය වාහන ලෙස ආනයනය කර පසුව සුඛෝපභෝගී කැබ් රථ ලෙස පරිවර්තනය සිදුකර තිබුණි.

(ii) රේගු සංයෝජිත අංක 8705 යටතේ විශේෂ කාර්යය වාහන ලෙස ආනයනය කර රේගු බදු අඩුවෙන් ගෙවා නිදහස් කරගෙන තිබුණු වාහන 22 ක් ද්විත්ව කාර්යය වෑන් රථ ලෙසද වාහන 56 ක් මෝටර් ලොරි ලෙසද ලියාපදිංචි කර තිබුණි.

(iii) සිංගල් කැබ් රථ ලෙස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර, පසුව ජීප් රථ ලෙස පරිවර්තනය කර ඇති වාහන 18 කින් සුඛෝපභෝගි බදු වශයෙන් රු.4,320,000ක් අයවිය යුතු වුවත්, එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) රේගු සටහන්කරයන්ට අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද යතුරු පැදි ප්‍රමාණය හා විස්තරයන් රේගු දෙපාර්තමේන්තුවේ පරිගණක තොරතුරු පද්ධතිය සමඟ සැසඳීමේදී දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරනු ලැබූ පාවිච්චි කරන ලද යතුරු පැදි 108 ක් නීත්‍යානුකූලව රේගු බදු ගෙවා ආනයනය කරන ලද වාහන බවට අනාවරණය නොවුණි.

## 5.12 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාලව 2012 හා 2013 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 12-ඇ,ඈ,ඉ,ඊ,උ,ඌ,එ, ඒ,ඔ,ක,ඛ,ග,ඝ,ච,ජ, ඡ,ට,ණ | මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු |

| | | |
|---|---|---|
| 2012 | 8- ඇ-(i),(ii),(iii) | කාර්ය සාධනය |
| 2012 | 10. අ,ඇ,ඈ,ඉ,ඊ,උ,ඌ,<br>එ,ඒ | මතභේදයට තුඩුදෙන ගනුදෙනු |
| 2012 | 11 – ඇ,ඈ | අවිධිමත් ගනුදෙනු |
| 2013 | 1.10 -අ, ආ,ඇ,ඈ,උ,එ,ඒ | වංචනික ස්වරූපයේ ගනුදෙනු |
| 2013 | 1.12 - ඈ, ඉ,ඊ, ඌ,එ,ඒ | කළමනාකරණ දුර්වලතා |

**5.13 කළමනාකරණ දුර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ නියමිත අනුමැතියක් ලබා ගැනීමකින් තොරව මෝටර් වාහන සකස් කිරීම , නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අළුතින් නිර්මාණය කිරීම, අනුවර්ථනය කිරීම, විකරණය කිරීම හෝ නිර්මාණය වෙනස් කිරීමේ කටයුතු ඇතුළු මෝටර් වාහන සම්බන්ධයෙන් ඇති වන විවිධ සාවද්‍ය ක්‍රියාකාරකම්වල නියැලෙන පුද්ගලයින්ව අනාවරණය කිරීමත් ඔවුනට විරුද්ධව නෛතිකමය ක්‍රියාමාර්ග ගැනීමත් අරමුණු කරගෙන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලක් පිහිටුවා තිබුණි. මෙම අරමුදල සඳහා මෝටර් රථ පනත යටතේ අයකරනු ලබන ගාස්තු ආදායමෙන් 1%ක මුදලක් සෑම වර්ෂයකම යොදවාගෙන තිබු අතර ත්‍යාග අරමුදල මඟින් විගණන නිරීක්ෂණවලින් පෙන්වා දෙනු ලැබූ අවිධිමත් ලෙස පරිවර්ථනය කරන ලද වාහන හඳුනා ගැනීමත් , ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමත් සිදු කල හැකි වුවද, එවැනි කිසිදු ක්‍රියාකාරකමක් මෙම ත්‍යාග හා දිරි දීමනා අරමුදල මඟින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පනතේ 18 වගන්තිය අනුව රක්ෂණ ආයතනවලින් තොරතුරු ලබාගෙන අනතුරකට පත්ව ධාවනයෙන් ඉවත්කරන ලද වාහනවල ලියාපදිංචිය අත්හිටුවීමට කටයුතු කළ යුතු වුවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුව මත මෙම වාහන තවදුරටත් ධාවනය වන වාහන ලෙස දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට අනුව පෙන්නුම් කරනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් කාලීනව ධාවනයෙන් ඉවත්කරන ලද වාහනවල ලියාපදිංචිය අවලංගු කිරිමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙලෙස ධාවනයෙන් ඉවත්කරන ලද වාහනවල අංකයන් යොදා ගනිමින් රේගු බදු නොගෙවා නීති විරෝධි

ලෙස ආනයනය කරන ලද හෝ සකසන ලද වාහනවල දත්ත මෙම වාහනවලට ඇතුලත් කරමින් හෝ මෙම වාහන හඳුනාගැනිමේ අංකය යොදා ගනිමින් අක්‍රමිකතාවයන් රාශියක් සිදු කිරිමට ඉඩකඩ සැලසී තිබුණි.

(ඈ) ගිලන් රථ හා අවමංගල්‍ය රථ වැනි විශේෂිත අරමුණු සඳහා භාවිතා කරනු ලබන වාහන ලියාපදිංචි කිරීමේදී , එකී විශේෂිත අරමුණින් බැහැර වීම වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත්/ විධිමත් ක්‍රියාවලියක් දෙපාර්තමේන්තුවෙහි නොතිබුණු බැවින් අක්‍රමිකතාවයන් රාශියක් සිදු වී තිබුණි. ඒ අනුව එවැනි ව්‍යාපාර කටයුත්තක් කරනු ලබන ආයතනයන්ට හෝ පුද්ගලයින්ට විශේෂිත බලපත්‍රයක් මඟින් පමණක් වාහන ආනයනය කිරීමට ඉඩකඩ ලබා දීම මඟින් මෙම අක්‍රමිකතාවයන් අවම කර ගැනීමේ හැකියාව විගණනය විසින් පෙන්වා දී තිබුණද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ පිටපළාත් කාර්යාලවලින් රියදුරු බලපත්‍ර ලබා දීම සඳහා අදාල ඉල්ලුම්පත් භාර ගැනීමෙන් පසුව ලිඛිත පරීක්ෂණය පවත්වා අදාල සියළුම ලියකියවිලි වේරහැර කාර්යාලයට එවීමෙන් පසු රියදුරු බලපත්‍රය මුද්‍රණය කරනු ලැබුවද, දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව පළාත් කාර්යාලවල නිළධාරීන් විසින් පූර්ණ දැනුවත්භාවයකින් හා නිසි සැලකිල්ලෙන් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් 2010 වර්ෂයේ සිට 2014 අගෝස්තු දක්වා විවිධ අඩුපාඩු හේතුවෙන් රියදුරු බලපත්‍ර 200 ක් පමණ මුද්‍රණය කිරීමට නොහැකි වී තිබු අතර දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

## 5.14 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෂ්ඨ මට්ටම | 27 | 24 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 21 | 05 | 16 | - |
| (iii) | ද්විතියික මට්ටම | 790 | 709 | 81 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 127 | 125 | 02 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **965** | **865** | **102** | **02** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 102 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

**(ආ) නිලධාරීන්ගේ අභ්‍යන්තර මාරුවීම් පිළිබඳ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 නොවැම්බර් 30 දිනැති අංක 05/2012 දරන අභ්‍යන්තර මාරුවීම් සම්බන්ධයෙන් වු චක්‍රලේඛයෙහි 06 ඡේදයට අනුව නිලධාරීන්ට අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ මෝටර් රථ නව ලියාපදිංචි කිරීමේ අංශයන් හා අයිතිය හුවමාරු වීමේ අංශයන් කිහිපයක් පවතින බැවින් එම අංශ ප්‍රධානීන්ගේ අවශ්‍යතා විමසීමකින් තොරව අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලැයිස්තුව පිළියෙල කර තිබුණි.